# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/11 - 2017 අගෝස්තු මස 15 වැනි අඟහරුවාදා - 2017.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2017 අගෝස්තු මස 16 වැනි දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2017.06.06 දිනැති අංක 2022/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් සීනි (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 17.01) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2017 අගෝස්තු මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

1A - PG 3655- 532 (2017/08)

මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*උපලේඛනය*

| 1 වැනි තීරය | | | | 11 වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 17.01 | | සන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනික පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රසකාරක හෝ වර්ණ අඩංගු නොවූ ශුද්ධ නොකල සීනි | |
| | | 1701.12 | බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 33.00 |
| | | 1701.13 | උක් සීනි | කි. ග්‍රෑමයට රු. 33.00 |
| | | 1701.14 | අනෙකුත් උක් සීනි | කි. ග්‍රෑමයට රු. 33.00 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | |
| | | 1701.91.10 | සීනි | කි. ග්‍රෑමයට රු. 33.00 |
| | | 1701.91.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 33.00 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 31.00 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 31.00 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි. ග්‍රෑමයට රු. 33.00 |
| | | 1701.99.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 33.00 |

08-1072

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.